| ०१ प्रथमः पाठः । |
|---|

# अमृतवाणी संस्कृतभाषा ।
## वर्णोच्चारणविधिः ।

සංස්කෘත භාෂාව භාරතයේ දැනට පවතින පුරාණතම ව්‍යාවහාරික භාෂාවකි. විධිමත් ව සකස්කරගත් භාෂාවක් වන බැවින් ඊට ''**සංස්කෘත**'' යන නම භාවිත කෙරේ. ''**දෛවීභාෂා**''යන අපර නාමයෙන් ද හඳුන්වනු ලබන මෙම භාෂාව **ශුද්ධ භාෂාවක්, සාංස්කෘතික භාෂාවක්, ධාර්මික භාෂාවක්, ඓතිහාසික භාෂාවක්, සාහිත්‍යයික භාෂාවක්, වෛඥානික භාෂාවක්, ප්‍රභාවොත්පාදක භාෂාවක් හා විශ්වභාෂාවක්** හැටියට සුප්‍රසිද්ධ ය. සංස්කෘත භාෂාව ලියා දැක්වීම සඳහා භාවිත කරන්නේ **දේවනාගරී අක්ෂරමාලාව යි.** අක්ෂරමාලාව යනු **දෘශ්‍ය සංකේතාවලියකි.** කථා කිරීමේ දී මුවින් නිකුත් වන ශබ්ද ලියා දක්වන දෘෂ්ටිගෝචර සංකේත, **අක්ෂර** හෙවත් **අකුරු** නමින් හැඳින්වේ.

සංස්කෘත භාෂාවේ සියලු අක්ෂර හතළිස් නවය (49)කි. එම අක්ෂරමාලාව **ස්වර** හා **ව්‍යඤ්ජන** වශයෙන් ප්‍රධාන කොටස් දෙකකට බෙදේ. ස්වර දාහතර (14)කි. ව්‍යඤ්ජන තිස්පහ (35)කි. පහතින් දැක්වෙන්නේ ඔබ මීට පෙර උගත් සංස්කෘත වර්ණමාලාවේ බෙදීම් ඇතුළත් සටහන් කිහිපයකි.

ස්වර 14

ව්‍යඤ්ජනාක්ෂරයන්ගේ උපකාරයක් නොමැති ව තනි ව උසුරුවනු ලබන අකුරු **ස්වරාක්ෂර** නම් වේ.

| ස්වර 14 | अ | आ | इ | ई | उ | ऊ | ऋ | ॠ | ऌ | ॡ | ए | ऐ | ओ | औ |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **හ්‍රස්ව 05** | अ | इ | उ | ऋ | ऌ | | | | | | | | | |
| **දීර්ඝ 09** | आ | ई | ऊ | ॠ | ॡ | ए | ऐ | ओ | औ | | | | | |
| **ප්ලුත** | මාත්‍රා තුනක උච්චාරණ කාලයක් ගත වන්නා වූ හඬ ප්ලුත නම් වේ. ගායනය, හැඬීම, දුර සිටින අයෙකුට අඬ ගැසීම හා විචාරය ආදි අවස්ථාවල දී අකුරු ප්ලුත ව කියවේ. වචන අවසානයේ ඇදී කියවීම ප්ලුත ස්වභාවය යි. ප්ලුතය ලියා දැක්වීමට නොහැකි ය. | | | | | | | | | | | | | |
| **සන්ධ්‍යක්ෂර 04** | ए | ऐ | ओ | औ | | | | | | | | | | |

| | |
|---|---|
| නාමින් / අනාමින් | අක්ෂරමාලාවේ **अ, आ** දෙක අනාමින් වන අතර අනෙක් සියලු ම ස්වර නාමින් නම් වේ. |
| සමාන / සවර්ණ | **अ इ उ ऋ ऌ** යන අකුරු පහ ලිවීමේ භේද වශයෙන් හා උච්චාරණ කාල වශයෙන් සමාන බැවින් සමාන / සවර්ණ නම් වේ. |

**ව්‍යඤ්ජන 35**

ස්වරාක්ෂරයන්ගේ උපකාරයක් නොමැති ව තනි ව උච්චාරණය කළ නොහැකි වර්ණ සමූහය **ව්‍යඤ්ජන** නම් වේ. (ස්වර සංයුක්ත ව්‍යඤ්ජන)

| | | | | | |
|---|---|---|---|---|---|
| कवर्ग | क | ख | ग | घ | ङ |
| चवर्ग | च | छ | ज | झ | ञ |
| टवर्ग | ट | ठ | ड | ढ | ण |
| तवर्ग | त | थ | द | ध | न |
| पवर्ग | प | फ | ब | भ | म |
| अन्तःस्थ | य | व | र | ल | |
| ऊष्मन् | श | ष | स | ह | |
| अनुस्वार | अं | | | | |
| विसर्ग | अ (ः) | | | | |


| स्वराः | | व्यञ्जनानि | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | अघोषशब्दाः | | घोषशब्दाः | | | | | | | अघोषशब्दाः |
| | | वर्गाक्षराः | | | | | | | | | |
| ह्रस्वस्वर | दीर्घस्वर | अल्पप्राण | महाप्राण | अल्पप्राण | महाप्राण | अल्पप्राण नासिक्य | अन्तःस्थ अर्धस्वर | ऊष्माक्षर | अनुस्वार | विसर्ग | ऊष्माक्षर |
| अ | आ | क | ख | ग | घ | ङ | य | ह | अँ | अः | श |
| इ | ई | च | छ | ज | झ | ञ | व | | | | ष |
| उ | ऊ | ट | ठ | ड | ढ | ण | र | | | | स |
| ऋ | ॠ | त | थ | द | ध | न | ल | | | | |
| ऌ | ॡ | प | फ | ब | भ | म | | | | | |
| गुण | ए | | | | | | | | | | |
| वृद्धि | ऐ | | | | | | | | | | |
| गुण | ओ | | | | | | | | | | |
| वृद्धि | औ | | | | | | | | | | |

**ස්වර පරිණාම වගුව**

සංස්කෘත භාෂාවේ ස්වරාක්ෂරයන්ගේ වර්ධන අවස්ථා පහත වගුවේ දැක්වේ. මෙම ස්වර පරිණාම වීම පිළිබඳ දැනුම සන්ධි කාර්යයේ දී වැදගත් වේ.

| ह्रस्व | दीर्घ | गुण | वृद्धि | व्यस्थ | अर्धस्वर |
|---|---|---|---|---|---|
| अ | आ | × | आ | × | × |
| इ | ई | ए | ऐ [ अय् ] → | आय् → | य् |
| उ | ऊ | ओ | औ [अव् ] → | आव् → | व् |
| ऋ | ॠ | अर् | आर् → | → | र् |
| ऌ | ॡ | अल् | आल् → | → | ल् |

උච්චාරණ අවයව පද්ධතිය අනුව අක්ෂරයක හඬ නිපදවීම සඳහා ප්‍රධාන අවයව පහක් අතිශයින් ම උපකාරී වේ. මෙම ස්ථාන අක්ෂරෝත්පත්තිස්ථාන යනුවෙන් හඳුන්වයි.




१. कण्ठः
२. तालुः
३. मूर्धा
४. दन्ताः
५. ओष्ठौ
६. नासिका

| | |
|---|---|
| कण्ठ्य | කණ්ඨය හෙවත් ගෙළ ඇසුරු කොටගෙන උපදින ශබ්ද |
| तालव्य | තල්ල ඇසුරු කොටගෙන උපදින ශබ්ද |
| मूर्धन्य | උඩුතල්ල ඇසුරු කොටගෙන උපදින ශබ්ද |
| दन्त्य | දත් ඇසුරු කොටගෙන උපදින ශබ්ද |
| ओष्ठ्य | දෙතොල් ඇසුරු කොටගෙන උපදින ශබ්ද |
| नासिक्य | නාසය ඇසුරු කොටගෙන උපදින ශබ්ද |
| कण्ठतालव्य | ගෙළ හා තල්ල ඇසුරු කොටගෙන උපදින ශබ්ද |
| कण्ठौष्ठ्य | ගෙළ හා තොල් ඇසුරු කොටගෙන උපදින ශබ්ද |
| दन्तौष्ठ्य | දත් හා දෙතොල් ඇසුරු කොටගෙන උපදින ශබ්ද |
| अनुनासिका | නාසය ඇසුරු කොටගෙන උපදින ශබ්ද |

## සූත්‍රානුසාරයෙන් අක්ෂරෝත්පත්තිස්ථාන හදාරමු.

| | |
|---|---|
| अकुहविसर्जनीयानां कण्ठः | अ, आ, क, ख, ग, घ, ङ, ह, ः කණ්ඨජ අකුරු වේ. |
| इचुयशानां तालु | इ, ई, च, छ, ज, झ, ञ, य, श තාලුජ අකුරු වේ. |
| ऋटुरषाणां मूर्धा | ऋ, ॠ, ट, ठ, ड, ढ, ण, र, ष  මූර්ධජ අකුරු නම් වේ. |
| ऌतुलसानां दन्ताः | ऌ, ॡ, त, थ, द, ध, न, ल, स දන්තජ අකුරු වේ. |
| उपूपध्मानीयानामोष्ठौ | उ, ऊ, प, फ, ब, भ, म  ඕෂ්ඨජ අකුරු වේ. |
| एदैतोः कण्ठतालुः | ए ,ऐ  කණ්ඨතාලුජ අකුරු වේ. |
| ओदौतोः कण्ठौष्ठम् | ओ,औ  කණ්ඨෞෂ්ඨජ අකුරු වේ. |
| वकारस्य दन्तौष्ठम् | व  දන්තෞෂ්ඨජ වේ. |
| ङञणनमानां नासिका | ङ, ञ, ण, न, म යන අකුරු නාසික්‍ය වේ. |
| जिह्वामूलीय - उपध्मानीय | ක, ඛ, දෙකට පෙරටුව සිටි ≍ ලකුණ ජිහ්වාමූලීය ( ≍ ක, ≍ ඛ,) හා  ප, ඵ දෙකට මුලින් සිටි ≍ ලකුණ උපධ්මානීය (≍ ප, ≍ ඵ) නමින් හැඳින් වේ. |

අප මෙතෙක් ඉගෙනගත් සංස්කෘත අක්ෂරමාලාවේ සියලු බෙදීම් පහත පරිදි වගුගත කළ හැකි ය.

| | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | स्वराः | | व्यञ्जनानि | | | | | | | | | |
| | | | अघोषशब्दाः | | घोषशब्दाः | | | | | | | अघोषशब्दाः |
| | | | वर्गाक्षराः | | | | | | | | | |
| | ह्रस्वस्वर | दीर्घस्वर | अल्पप्राण | महाप्राण | अल्पप्राण | महाप्राण | अल्पप्राण नासिक्य वर्गान्त | अन्तःस्थ अर्धस्वर | ऊष्मन् | अनुस्वार | विसर्ग | ऊष्मन् |
| कण्ठज | अ | आ | क | ख | ग | घ | ङ | | ह | अँ | अ(ः) | |
| तालुज | इ | ई | च | छ | ज | झ | ञ | य | | | | शः |
| मूर्धज | उ | ऊ | ट | ठ | ड | ढ | ण | र | | | | ष |
| दन्तज | ऋ | ॠ | त | थ | द | ध | न | ल | | | | स |
| ओष्ठज | ऌ | ॡ | प | फ | ब | भ | म | | | | | |
| कण्ठतालु | ए | | | | | | | | | | | |
| | | ऐ | | | | | | | | | | |
| कण्ठोष्ठज | | ओ | | | | | | | | | | |
| | | औ | | | | | | | | | | |
| दन्तोष्ठज | | | | | | | | व | | | | |

**හලන්ත**

**क** ක සිට **ह** හ දක්වා ඇති වර්ණ රාශිය ස්වරයක ආධාරයෙන් තොර ව උච්චාරණය කළ නොහැකි ය. ඉහත ඇත්තේ ස්වර සංයුක්ත ව්‍යඤ්ජන වර්ණයෝ යි. ඒවායේ ශුද්ධ ස්වභාවය මෙපරිදි ය.

**क् ख् ग् घ् ङ्  - च् छ् ज् झ् ञ् - ट् ठ् ड् ढ् ण्  - त् थ् द् ध् न्**
**प् फ् ब् भ् म्  - य् र् ल् व्  - श् ष् स् ह्**

මෙම අක්ෂර සිංහල භාෂාවේ හැඳින්වෙන්නේ ''හල්'' අකුරු නමිනි. හල් කිරීමේ ලකුණ දේවනාගරීවල යෙදෙන්නේ අකුරුවලට යටිනි. ස්වර හා සංයෝග නොවූ මෙම ව්‍යංජන හලන්ත හෙවත් හල් අකුරු නමින් හැඳින්වේ.

**ක්‍රියාකාරකම 1.1**


01. ඔබ ඉහත ඉගෙන ගත් සංස්කෘත අක්ෂරමාලාව පහත වගුවට අනුව සකසන්න.


| स्वराः | | | | | |
|---|---|---|---|---|---|
| ह्रस्वाः | दीर्घाः | गुणाः | वृद्धयः | नामिनः | सन्ध्यक्षराणि |
| | | | | | |

02. ඔබ ඉහත ඉගෙන ගත් සංස්කෘත අක්ෂරමාලාව පහත වගුවට අනුව සකසන්න.

| व्यञ्जनानि | | | | | |
|---|---|---|---|---|---|
| अल्पप्राणाः | महाप्राणाः | नासिक्याः | अन्तःस्थाः | ऊष्मन् | सन्ध्यक्षराणि |
| | | | | | |

03. පහත භාජනයේ ඇති අක්ෂරවලින් ඝෝෂාක්ෂර හා අඝෝෂාක්ෂර වෙන්කර වෙන වෙන ම ලියා දක්වන්න.



**ක්‍රියාකාරකම 1.2**

01. පහත අක්ෂර අතරින් වර්ගාක්ෂර වෙන් කර ලියන්න.

ञ ओ य थ अ इ ऐ ग ऊ ॠ ई घ ङ श ब
ठ ख ह औ उ आ छ ऌ ए प त ट ल र
द ड ज ढ ध भ न म च ॡ ष ण फ स क
व झ अँ अः

**ක්‍රියාකාරකම 1.3**

01. පහත සඳහන් ඡේදය සිංහල අක්ෂර භාවිත කර නිවැරදි ව ලියන්න.

## अनृतभाषिणो मेषपालस्य ।

आसीदेकस्मिन् ग्रामे कश्चिन्मेषपालः। स कदाचित् सुदूरमनयत् स्वयूथम्। बहवो वृक्षास्तत्रासन् निबिडा च तेषां छाया। रविकिरणा अपि क्वचित् क्वचिदेव प्रवेशमलभन्त तस्मिन्स्थाने। मध्याह्नेऽपि सुशीतलं तत्स्थलम्। विपुलानि तृणपर्णानि निर्मलाश्च बहवो निर्झरा आसन् स्थाने स्थाने। तत्र कस्यचित्तरोर्मूले विश्रान्तिमनुभवतस्तस्य यूनो मनसि समुत्पन्नः सहसैवैष विचारः। निर्जनमेतद्वनम्। यदि कश्चिदन्यपशुरत्रापतेत् तर्हि किं करिष्यामि। असहायोऽहमेतैर्मेषैः सह तस्य भक्ष्यमवश्यं भविष्यामि। परीक्षे तावद्यदि कोऽपि मानुषोऽत्र समीपे तिष्ठति न वेति। एवं संप्रधार्य भो भो वृक इहायातो वृक इहायात इत्युच्चैराक्रोशत् स युवा। एतच्छ्रुत्वा समीपस्थाः क्षेत्रपालाः शस्त्राण्यादाय तत्र प्राप्ताः सत्वरं साहाय्यार्थं तान् दृष्ट्वाप्रीतमनाः स मेषपालोऽवदत्। नात्र वृकः परं समीपे जनानां निवासो विद्यते न वेति ज्ञातुमेवाहं तथाऽक्रोशमिति। एतद्वचनं निशम्य यथागतं निवृत्तास्ते कृषीवलाः अन्येद्युस्तथैव विनोदार्थं स आक्रोशत्। पुनरपि शस्त्रपाणीन् जनानागतान् दृष्ट्वाऽसौ पर्यहसद् वृको नास्तीति चावदत्। इत्थं बहुवारं वञ्चितास्तेप्रातिवेशिकास्तेन मिथ्यावादिना।

अथैकस्मिन् दिने परमार्थत एकः तत्रायातः केचिद् वृका मेषाणां गन्धेनाकृष्टाः। तान्दृष्ट्वा भीतिग्रस्तः स युवा "वृका आयाता वृका आगता" इत्याक्रोशत्। यथापूर्वमुच्चैः समाह्वयच्च प्रातिवेश्यान्। परं तत्राद्य न यामो यतः स दुर्मतिरस्मान् वञ्चयति परिहसति चेति तैर्प्रातिवेशिकैर्मिथो निश्चितम्। अथ साहाय्यार्थमनागतेषु जनेषु वृकैर्भक्षिता बहवो मेषाः। स पालकोऽपि किंचित् पीडितः।
एवमनृतभाषिणस्तस्य प्राप्तो दण्डः।

नासत्यवादिनः पुण्यं न सख्यं न यशो भुवि।
दृश्यते नापि कल्याणं कालकूटमिवाशन्तः॥

(अभिनवपाठावली २)

**ක්‍රියාකාරකම 1.4**

01. ඉහත සඳහන් කළ උත්පත්ති ස්ථානයන්ට අනුව පංතියේ කණ්ඩායම් වශයෙන් ශබ්ද නගා අක්ෂරෝච්චාරණය කරන්න.

02. සංස්කෘත අක්ෂරමාලාව ආශ්‍රයෙන් පහත වගුව සම්පූර්ණ කරන්න.

| | |
|---|---|
| कण्ठजाः | |
| तालुजाः | |
| मूर्धजाः | |
| दन्तजाः | |
| ओष्ठजाः | |
| नासिक्याः | |
| कण्ठतालुजौ | |
| कण्ठौष्ठजौ | |
| दन्तौष्ठजः | |

**ක්‍රියාකාරකම 1.5**

01. පහත සඳහන් ප්‍රකාශනවල හිස්තැන්වලට සුදුසු පද යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න.

i. **म, क, थ, अ, ऌ, ग, ट, ह, द** යන අක්ෂරවලින් .................... යන අක්ෂර කණ්ඨජ අක්ෂර වන අතර .................... යන අක්ෂර දන්තජ අක්ෂර වේ.

ii. **ए ,ऐ** .................... අක්ෂර වන අතර **व** .................... අක්ෂරයක් වේ.

iii. **ङ, ञ, ण,न, म** යන අක්ෂර .................... අක්ෂර ලෙස හැඳින් වේ.

iv. දිවේ මුල කොටස උගුර දෙසට ළං වීමෙන් උපදින ශබ්ද..................... අක්ෂර ලෙස හැඳින් වේ.

v. ඕෂ්ඨජ අක්ෂර යනු .................... උපදින අක්ෂර වේ.

vi. එක් ස්ථානයකින් උපදින අකුරු....................නමින් හඳුන්වන අතර ද්විජ අක්ෂර යනු .................... උපදින අක්ෂරයි.

vii. වර්ගයන්ගේ පළමුවන දෙවන හා ශ, ෂ, ස යන අකුරු .................... වන අතර මහත් වූ ශබ්දයකින් උච්චාරණය වන අකුරු .................... නමින් හැඳින් වේ.


viii. ස්වර ස්වභාවයත්, ව්‍යඤ්ජන ස්වභාවයත් ඇති අකුරු .................... නමින් හඳුන්වන අතර ඒවා .................... යන අකුරු යි.

ix. වර්ගාන්ත අකුරු .................... නමින් ද හඳුන්ව යි.

x. වර්ගයන්ගේ පළමු අක්ෂර පහ .................... නමින් ද හැඳින් වේ.

**ක්‍රියාකාරකම 1.6**

01. පහත දක්වා ඇති සංස්කෘත අක්ෂරමාලාව උත්පත්ති ස්ථාන අනුව වර්ග කර ඉදිරියෙන් දක්වා ඇති කොටු තුළ ලියන්න.



अकालमेघवद्वित्तमकस्मादेति याति च।

ධනය අකල් වැස්සක් මෙනි. අහම්බෙන් මෙන් ලැබෙයි. එසේ ම නැතිවී යයි.

अक्षौभ्यतौ वमयतां महत्वस्य हि लक्षणम्।

නොකැළඹීම හා නොතැවීම උතුම් බවෙහි ලක්‍ෂණය යි.

अङ्कमारुह्यसुप्तं हि हत्वा किं नाम पौरुषम्।

උකුලේ නිදන්නා නසා කවර වීරත්‍වයක් ද?